සීඒ/6/1/16/2 2021.10.

බුද්ධශාසන, ආගමික සංස්කෘතික හා කටයුතු අමාත්‍යාංශය,

චක්‍රලේඛ/2021/03

සියලුම සංස්කෘතික මධ්‍යස්ථාන භාර නිලධාරීන් වෙත,

**අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රතිභා සංගීත (ගායන/වාදන) තරගාවලිය -2021**

**සංගීත තරගාවලිය - 2021**

හැඳින්වීම.

දැයේ දූ දරුවන් සෞන්දර්ය අධ්‍යාපනයට නැඹුරු කරමින් ඔවුන්ගේ කලා කුසලතා වර්ධනය කරවීම මගින් සංවේදී සුචරිතවත් අනාගත පරපුරක් බිහිකිරීමේ අරමුණෙන් ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන කේන්ද්‍ර කරගෙන පවත්වනු ලබන සුවිශේෂී වැඩසටහනකි.

1. අරමුණ
    1. සිසු පරපුරෙහි රසඥතාව වර්ධනය කරවීම
    2. සිසුන්ගේ නිර්මාණාත්මක කුසලතා වර්ධනය කරවීම හා ඒ සඳහා වේදිකාව විවර කරවීම.
    3. සංස්කෘතික මධ්‍යස්ථාන වල කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම හා ඇගයීමට අවස්ථාව ලබාදීම.

2. උපදෙස්

    1. 2021 වර්ෂයේ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් මෙවර ප්‍රතිභා තරගාවලිය සීමිත තරග ශීර්ෂ කිහිපයකට යටත්ව පැවැත්වීමට අදහස් කර ඇත.
    2. ඉදිරිපත්වන සෑම තරගකරුවෙකුම සංස්කෘතික මධ්‍යස්ථානයේ 2020.01.01 සිට 2021.03.31 දින දක්වා ලියාපදිංචි වූ අයෙකු විය යුතුය.
    3. තරග පැවැත්වෙන ආසන්නයේ තරග සඳහා බඳවා ගන්නා සිසුන් හෝ වෙනත් ආයතනයක සිසුන් ඉදිරිපත් කිරීම සම්පූර්ණයෙන් තහනම්ය.
    4. තරග වලට සහභාගී වීමේදී මධ්‍යස්ථානවල ලියාපදිංචි වී නොමැති සිසුන් ඉදිරිපත් කර ඇති බව අනාවරණය වුවහොත් අදාළ මධ්‍යස්ථානය තරඟයෙන් ඉවත් කරනු ලබන අතර ව්‍යාජ තොරතුරු සැපයීම සම්බන්ධයෙන් මධ්‍යස්ථාන නිලධාරීන්ට විනයානුකූලව කටයුතු කරනු ඇත. එමෙන් ම තරග අවලංගු කරනු ලබන මධ්‍යස්ථානයකට ශූරතාව හෝ අනුශූරතාව අහිමි වනු ඇත.
    5. පළාත් මට්ටමේ හා ජාතික මට්ටමින් අදියර දෙකක් යටතේ තරගාවලිය පවත්වන අතර පළාත් තරගයේදී ලකුණු 70 වට වැඩි පළමු ස්ථාන ලබා ගන්නා තරග ශීර්ෂ පමණක් ජාතික තරගය සඳහා සුදුසුකම් ලබනු ඇත. ජාතික තරගය පැවැත්වෙන ස්ථානය හා දිනය පසුව දන්වනු ලැබේ.
    6. පළාත් වටයෙහි තරග අංශයන් සඳහා සහභාගී වී ජයග්‍රහණය කරනු ලබන සිසුන් පමණක් ජාතික වටයේ තරග සඳහා ඉදිරිපත් කිරීම අනිවාර්යය වන අතර ජාතික තරගය සඳහා වෙනත් සිසුන් ඇතුලත් කිරීම තරගයෙන් ඉවත් කිරීමට හේතුවේ.

7. ජාතික තරගය සඳහා සුදුසුකම් ලැබූ සිසුන් රැගෙන ඒම සඳහා අමාත්‍යාංශය මගින් ප්‍රවාහන වියදම් ලබා දෙනු ඇත.
8. තරග විනිශ්චය සඳහා චක්‍රලේඛය සමග යාකොට ඇති ලකුණු ලබාදීමේ පටිපාටිය උපයෝගී කරගනු ඇත.
9. ආදර්ශ අයදුම් පත්‍රයේ අංක 01 සිට 06 දක්වා සම්පූර්ණ කර 2021.11.15 දිනට ප්‍රථම ප්‍රවර්ධන ශාඛාවට ලැබීමට සැලැස්විය යුතුය.
10. අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී තරග ශිර්ෂ සඳහා වෙන වෙනම අයදුම් කිරීමට කටයුතු කරන්න.
11. පළාත් තරගය පැවැත්වෙන දිනය වන විට යොමු කරන ලද නාමලේඛනයෙහි නම් වෙනස් වන්නේ නම් ඒ බව පිළිගතහැකි හේතු සමග විෂය භාර අතිරේක ලේකම් හෝ එම අංශයෙහි මාණ්ඩලික නිළධාරියකු දැනුවත් කර පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.
12. නියමිත දිනට පසුව එවනු ලබන අයදුම් පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලැබේ.
13. සංගීත නර්තන දෙඅංශයම මධ්‍යස්ථානයෙහි ක්‍රියාත්මක වන්නේ නම් අංශ දෙකම නියෝජනය වන පරිදි අවම වශයෙන් එක් තරග ශීර්ෂයකට හෝ සිසුන් ඉදිරිපත් කල යුතුය.
14. කිසිදු තරගයකට ඉදිරිපත් නොවූ සංස්කෘතික මධ්‍යස්ථානවල සම්පත්දායක දීමනා නවතා දැමීමට කටයුතු කරනු ඇත.
15. ජාතික හැඳුනුම්පත/ තැපැල් හැඳුනුම්පත/ උප්පැන්න සහතිකයෙහි ඡායාපිටපතක් අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා අනිවාර්යයෙන්ම ඉදිරිපත් කල යුතුය.
16. චක්‍රලේඛය සම්බන්ධයෙන්/ තරගාවලිය සම්බන්ධයෙන් යම් ගැටළුවක් ඇතිවුවහොත් ඒ පිළිබඳව බුද්ධශාසන. ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ.

03. තරග කොන්දේසි.

01. සමස්ත තරගාවලියෙහි වයස් සීමාවන් පහත පරිදිවේ.
- **කණිෂ්ඨ අංශය - වයස අවුරුදු 11-15 අතර**
- **ජ්‍යෙෂ්ඨ අංශය - වයස අවුරුදු 16 - 20 අතර**

**02.** එක් මධ්‍යස්ථානයකින් වයස් සීමාවන් දෙකම නියෝජනය වන පරිදි (කණිෂ්ඨ/ජ්‍යෙෂ්ඨ)තරග ශීර්ෂ 02 කට පමණක් ඉදිරිපත් විය හැකිය.
උදා - කණිෂ්ඨ අංශය නියෝජනය කරමින් සහභාගි විය හැක්කේ එක් තරග ශිර්ෂයකට පමණි.
**03.** තරග සඳහා වයස් සීමා ගණනය කිරීම අදාල වර්ෂයේ 2021.11.15 දිනට සලකනු ලැබේ.
**04.** එක් ශිෂ්‍යයෙකුට සහභාගී විය හැක්කේ තරග ශීර්ෂ එකකට පමණි.

උදා - 1.1.ශාස්ත්‍රීය ගායනය / වාදන (ඒකල) කණිෂ්ඨ
1.1.1. ගායනය (හින්දුස්ථානි) - ගැහැණු / පිරිමි
හෝ
1.1.2.වාදනය (හින්දුස්ථානි) - ගැහැණු / පිරිමි
1.1.2.1. සුෂිර වාද්‍ය භාණ්ඩ ( බටනලාව)

**05.** එකම දිනක තරග පැවැත්වෙන බැවින් තරග අංග වලට බාධා නොවන පරිදි සිසුන් තෝරාගත යුතුය.
**06.** අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවක ශිෂ්‍ය අනන්‍යතාවය පැහැදිලි කර ගැනීම සඳහා ලියාපදිංචි ලේඛනය ඉදිරිපත්කල යුතුය.
**07.** අනන්‍යතාවය තහවුරු කිරීමට නොහැකි තරගකරුවන් සිටියහොත් ජයග්‍රහනය කල ද අවලංගු කරනු ලැබේ.
**08.** ජාතික තරග වටයේදී නියමිත ඇඳුම් කට්ටලයකින් සැරසී ඉදිරිපත්විය යුතුය.
**09.** පෙර වසර වලදී ප්‍රතිභා තරග සඳහා නිර්මාණය කල නිර්මාණ ඉදිරිපත් නොකල යුතුය.
**10.** එමෙන්ම ප්‍රතිභා තරග සඳහා නිර්මාණය කරන නිර්මාණ ගී පද ජාති ,ආගම්, කුලභේද වලට හෝ පටු දේශපාලනික අදහස් උදහස් වලට තුඩු නොදෙන, එවැනි අදහස් ගම්‍ය නොවන ඒවා විය යුතුය.

**11.** තරග නීතිරීති උල්ලංඝනය කිරීම පිළිබඳව ගැටළු ඇතිවුවහොත් ඒ අවස්ථා වලදී විධිමත් පරීක්ෂණයකින් පසුව අදාල තරග ප්‍රතිඵල අත්හිටුවීමට, සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට ප්‍රතිඵල ලේඛන වලින් ඉවත් කිරීම හෝ අමාත්‍යාංශ ලේකම් ගේ උපදෙස් මත විෂයභාර මාණ්ඩලික නිළධාරීන්ට සිදු කල හැකිය.

**12.** අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී තරග ශීර්ෂ සඳහා වෙන වෙනම අයදුම් කිරීමට කටයුතු කරන්න.

04. සහතික හා සම්මාන ප්‍රදානය

1. පළාත් තරගාවලියෙන් ප්‍රථම ,දෙවන සහ තෙවන ස්ථාන සඳහා සහතික පත් පිරිනැමීම සිදුවේ.
1. ජාතික තරගයේ ප්‍රථම, දෙවන, තෙවන ස්ථානවලට සහතිකපත් හිමිවන අතර ලකුණු 70 ට වැඩියෙන් ලබාගෙන ප්‍රථම ස්ථානය හිමිකර ගන්නා තරග අංශය සඳහා පමණක් සම්මානයක් හිමිවේ.
2. සමස්ත තරගාවලියේම ලබාගන්නා ස්ථානයන් පාදක කරගනිමින් ලබාදෙන ලකුණු අනුව වැඩිම ලකුණු ප්‍රතිශතය ලබා ගන්නා මධ්‍යස්ථානය සඳහා ශූරතාවය ද දෙවන ලකුණු මට්ටම ලබා ගන්නා මධ්‍යස්ථානය සඳහා අනු ශූරතාවය ද හිමිවේ.

**05. <u>තරඟ ශීර්ෂ</u>**

**<u>01. ශාස්ත්‍රීය අංශය</u>**

1.1.ශාස්ත්‍රීය ගායනය / වාදන (ඒකල) කණිෂ්ය

1.1.1. ගායනය (හින්දුස්ථානි) - ගැහැණු / පිරිමි

1.1.2.වාදනය (හින්දුස්ථානි) - ගැහැණු / පිරිමි

1.1.2.1. සුෂිර වාද්‍ය භාණ්ඩ ( බටනලාව)
1.1.2.2.තත් වාද්‍ය භාණ්ඩ (වයලින්/එස්රාජ්/සිතාර්/ගිටාර්/සංතූර්)
1.1.2.3.ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ (හාර්මෝනියම්)
1.1.2.4.තාල වාද්‍ය භාණ්ඩ(තබ්ලාව/පඛාවාජ්)

1.1.3. ගායනය (කර්ණාටක) - ගැහැණු / පිරිමි

1.1.4.වාදනය (කර්ණාටක) - ගැහැණු / පිරිමි

1.1.4.1. සුසිර වාද්‍ය භාණ්ඩ ( බටනලාව)
1.1.4.2.තත් වාද්‍ය භාණ්ඩ (වීණාව / වයලින්)
1.1.4.3.තාල වාද්‍ය භාණ්ඩ (මෘදංගය/ඝටම්/ගන්ජීරා)
1.1.4.4.යුගල වාදනය (නාදස්වරම් / තවිල්)

1.2.ශාස්ත්‍රීය ගායනය / වාදන (ඒකල) ජොෂ්ය

1.2.1.-ගායනය (හින්දුස්ථානි) - ගැහැණු / පිරිමි
1.2.2.-වාදනය (හින්දුස්ථානි) - ගැහැණු / පිරිමි

1.2.2.1. සුෂිර වාද්‍ය භාණ්ඩ ( බටනලාව )
1.2.2.2.තත් වාද්‍ය භාණ්ඩ (වයලින්/එස්රාජ/සිතාර්/ගිටාර්)
1.2.2.3.ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ (හාර්මෝනියම්)
1.2.2.4.තාල වාද්‍ය භාණ්ඩ(පඛාවාජ් / තබ්ලාව)

1.2.3.ගායනය (කර්ණාටක) - ගැහැණු / පිරිමි (ඒකල)

1.2.4. වාදනය (කර්ණාටක) - ගැහැණු / පිරිමි (ඒකල)

1.2.4.1. සුෂිර වාද්‍ය භාණ්ඩ ( බටනලාව )

1.2.4.2.තත් වාද්‍ය භාණ්ඩ (වීණාව /වයලින්)

1.2.4.3.තාල වාද්‍ය භාණ්ඩ(මෘදංගය/සටම්/ගන්ජීරා)

1.1.4.4.යුගල වාදනය (නාදස්වරම් /තවිල්)

## 06. <u>තරඟ ශීර්ෂ නිර්ණායක</u>

### <u>1.ශාස්ත්‍රීය අංශය</u>

<u>1.1.ශාස්ත්‍රීය ගායනය / වාදනය (ඒකල) කණිෂ්ඨ</u>

1.1.1.ගායනය (හින්දුස්ථානි) - ගැහැණු / පිරිමි

- නිර්දේශිත රාග භූපාලි/භීමපලාසී /යමන්
- ඛ්‍යාල් ශෛලියට අයත් ගායන අංග සහ පූර්ව , මධ්‍යලය ආලාප, තානාලංකාර විවිධ තාල වර්ග ආදි අංග උචිත පරිදි යොදා ගත හැකිය.
- සාම්ප්‍රදායට අනුකූලවන පරිදි සුදුසු මධ්‍යලයට හෝ ධෘතලයට අයත් ගීතයක් අවශ්‍ය ශාස්ත්‍රීය ගායන අංග භාවිතා කරමින් ඉදිරිපත් කළ යුතුය.
- සහය වාදන සඳහා සම්ප්‍රදායට අනුකූලව වන පරිදි සුදුසු වාද්‍ය භාණ්ඩ පමණක් යොදා ගත හැකි අතර විද්‍යුත් තාම්පුරාවක් හෝ ශ්‍රැති මංජුසාවක් හෝ භාවිතා කළ හැකිය.
- තරඟකරුවෙකු සමඟ සහභාගි විය හැකි උපරිම ගණන 04කි.
- කාලය අවම විනාඩි 05 හා උපරිම විනාඩි 07ක් විය යුතුය.

1.1.2.වාදනය (හින්දුස්ථානි) - ගැහැණු / පිරිමි

1.1.2.1 සුෂිර වාද්‍ය භාණ්ඩ (බටනලා / ෂෙනායි)

1.1.2.2 තත් වාද්‍ය භාණ්ඩ (වයලින්/ එස්රාජ්/ සිතාර්/ ගිටාර්/ සන්තූර්/ සරෝද්/

1.1.2.3 ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ (හර්මෝනියම්)

- නිර්දේශිත රාග - බිලාවල්/ භූපාලි/ යමන්/භෛරවී/ කාෆි
- සාම්ප්‍රදායට අනුකූල වන පරිදි සුදුසු මාධ්‍යලයට හෝ ධ්‍රැතලයට අයත් වාදිතයන් අවශ්‍ය ශාස්ත්‍රීය වාදන අංග සහ නියමිත වාද්‍ය භාණ්ඩ පමණක් භාවිත කරමින් ඉදිරිපත් කළ යුතුය.
- ඛ්‍යාල් ශෛලියට හෝ ගත් ශෛලින්ට අයත් වාදන අංග සහ පූර්ව, මධ්‍ය ආලාප, විවිධ තාල වර්ග ආදි අංග උචිත අයුරින් යොදා ගත හැකිය.
- සහය වාදන සඳහා සම්ප්‍රදායට අනුකූල වන පරිදි සුදුසු වාද්‍ය භාණඩ හා විද්‍යුත් තම්පුරාවක් පමණක් යොදා ගත හැකි අතර ශ්‍රැති මංජුසාවක් යොදාගත හැකිය.
- තරඟකරු සමඟ සහභාගි විය හැකි උපරිම ගණන 04කි.
- කාලය අවම විනාඩි 05ක් හා උපරිම විනාඩි 07ත් අතර විය යුතුය.
- ධූන් ශෛලියේ වාදන අංග මේ සඳහා අදාළ නොවේ.
- ඉහත අංක 1.1.2.1, 1.1.2.2., 1.1.2.3. යන තරඟ ශීර්ෂ යටතේ වාදන භාණ්ඩ වර්ග කර ඇති අතර වෙන් වෙන් වශයෙන් වාද්‍ය භාණ්ඩ සලකා බලනු නොලැබේ.

1.1.2.4. තාල වාද්‍ය භාණ්ඩ (තබ්ලාව/ පඛාවාජ්/)

- නිර්දේශිත තාලය - ත්‍රිතාල්/ ජප්තාල්
- තාලයට අදාළ පරිදි වාදනයේ දී අන්තර්ගත විය යුතු සියලුම පද වර්ගයන් පිළිවෙලින් සකස් වු වාදනයක් විය යුතුය.

- විලම්බ ලයෙන් අරඹා කර මධ්‍ය ලය සහ ධ්‍රැත ලය දක්වා වාදනය
- පේෂ්කාර, කයදා (ගුණකිරීම් අනුව) , පල්ටා, ගත්, පරන්, ටුකුඩා ,මුකුඩා, තිහායි, චක්‍රදාර් පරන්, ආදි පද කොටස්වලින් සමන්විත යුතුය.
- නිවැරදි වාදන ඉරියව් සහ හස්ත සාධන පිළිබඳ අවධානය යොමු විය යුතුය.

- කාලය අවම විනාඩි 05ත් හා උපරිම විනාඩි 07ත් අතර විය යුතුය.
- වාදකයා ඇතුලුව උපරිම තිදෙනෙක් සහභාගි කරගත හැක. (ලෙහෙරාව සහ තාම්පුරා වාදනය සඳහා)
- කාලය පිළිබඳ මනා අවබොධයකින් ලයකාරි වාදනය ඉදිරිපත් කිරීම.

1.1.3. ගායනය - කර්ණාට (කර්ණාටක) - ගැහැණු / පිරිමි (ඒකල) කණිෂ්ඨ

- නිර්දේශිත රාග - මෝහනම්,කල්‍යාණී,හරිහරප්‍රිය,හරිකාම්බොජි
- තෝරාගත් රාගයට අදාල කීර්තනම් ගායන අංගයක් ඉදිරිපත් කළ යුතුය.
- ශෛලියට අදාළ ශාස්ත්‍රීය ගායන අංග ඇතුළත් විය යුතුය.
- තරඟකරු සමඟ සහභාගි විය හැකි උපරිම ගණන 04කි.
- කාලය අවම විනාඩි 05ත් උපරිම විනාඩි 07ත් අතර විය යුතුය.
- ශෛලියට අනුව සහය වාදන භාණ්ඩ යොදා ගත යුතුය.

1.1.4.වාදනය (කර්ණාටක) - ගැහැණු / පිරිමි

1.1.4.1.සුෂිර වාද්‍ය භාණ්ඩ ( බටනලාව / නාදස්වරම්)

1.1.4.2.තත් වාද්‍ය භාණ්ඩ (වීණාව / වයලින්)

1.1.4.3.ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ (හාර්මෝනියම්)

- නිර්දේශිත රාග - කරහරප්‍රිය/මේජකල්‍යානි/හනුමන්තෝඩි/හරිකම්බොජි
- තෝරාගත් රාගයට අයත් කීර්ත නම් ගායන අංගයක් ඉදිරිපත් කළ යුතුය.
- ශෛලියට අදාළ ශාස්ත්‍රීය ගායන අංග ඇතුළත් විය යුතුය.
- තරඟකරු සමඟ සහභාගි විය හැකි උපරිම ගණන 04කි.
- කාලය අවම විනාඩි 05ත් 07ත් අතර විය යුතුය.
- ශෛලියට අනුව සහය වාදන භාණ්ඩ යොදා ගත යුතුය.

1.1.4.4. තාල වාදය භාණ්ඩ (මෘදංගම්/ ඝටම්/ තවිල්/ ගන්ජිරා)

- නිර්දේශිත තාලය - රූපකාලම්/ ආදිතාලම්
- තාලයට අදාළ පරිදි වාදනයේදී අන්තර්ගත සියළුම පද වර්ග පිළිවෙලින් සකස් වූ තාල වාදනයක් විය යුතුය.
- සාම්ප්‍රදායික වාද්‍ය ශිල්ප ක්‍රම භාවිතා කළ යුතුය.
- කාලය අවම විනාඩි 05 ත් උපරිමය විනාඩි 07ක් අතර විය යුතුය.
- සහාය වාදන ශිල්පියා යොදාගත හැකිය.

<u>1.2. ශාස්ත්‍රීය ගායන/වාදන (ඒකල)ජ්‍යෙෂ්ඨ</u>

1.2.1. ගායනය -(හින්දුස්ථානී) ගැහැණු/පිරිමි

- නිර්දේශිත රාගය - ජෝග්/ජයජයවන්ති/දර්බාරිකානඩා
- තරගකරු සමග සහභාගී විය හැකි උපරිම ගණන 04 කි.
- ඛ්‍යාල් ශෛලියේ විලම්ලය මධ්‍යලය සහ ධ්‍රැතිලයට අයත් ගායනයක් අවශ්‍ය ශාස්ත්‍රීය ගායන අංග සහ නියමිත සහය වාද්‍ය භාණ්ඩ පමණක් භාවිතා කරමින් ඉදිරිපත් කළ යුතුය.
- කාලය අවම විනාඩි 05 ත් උපරිම විනාඩි 07 ත් අතර විය යුතුය.

1.2.2. වාදනය --( හින්දුස්ථානී )- ගැහැණු / පිරිමි

1.2.2.1. සුසිර වාද්‍ය භාණ්ඩ (බටනලා)

1.2.2.2. තත් වාද්‍ය භාණ්ඩ (වයලීන්/එස්රාජ්/සිතාර්/ගිටාර්/සංතූර්/සරෝද්/දිල්රුබා)

1.2.2.3. ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ (හාර්මෝනියම්)

- ඛ්‍යාල් ශෛලියට හෝ ගත් ශෛලියට අයත් වාදන අංග සහ පූර්ව මධ්‍ය ආලාප තානාලංකාර, ඣලා විවිධ තාල වර්ග ආදී අංග උචිත පරිදි යොදා ගත හැකිය.
- සම්ප්‍රදායට අනුකූල වන පරිදි සුදුසු මධ්‍ය ලයට හෝ ධෘත ලයට අයත් වාදිතයක් අවශ්‍ය ශාස්ත්‍රීය වාදන අංග සහ නියමිත වාද්‍ය භාණ්ඩ පමණක් භාවිත කරමින් ඉදිරිපත් කළ යුතුය.
- සහාය වාදන සඳහා සම්ප්‍රදායට අනුකූල වන පරිදි සුදුසු වාද්‍ය භාණ්ඩ පමණක් යොදා ගත හැකි අතර තාම්පුරාවක් හෝ ශ්‍රැති මංජුසාවක් හෝ භාවිතා කළ හැකිය.
- තරගකරු සමඟ සහභාගී විය හැකි උපරිම ගණන 04 කි.
- කාලය අවම විනාඩි 05 ත් හා උපරිම විනාඩි 07 ක් විය යුතුය.
- ධුන් ශෛලියේ වාදන අංග මේ සඳහා අදාළ නොවේ.
- ඉහත අංක 1.2.2.1.,1.2.2.2 සහ 1.2.2.3 යන තරඟ ශීර්ෂ යටතේ වාදන භාණ්ඩ වර්ග කර ඇති අතර, වෙන්වෙන් වශයෙන් වාද්‍ය භාණ්ඩ සලකා බලනු ලැබේ.
- කාලය අවම විනාඩි 05 ත් හා උපරිම විනාඩි 07ත් අතර වියයුතුය.

1.2.2.4. තාල වාද්‍ය භාණ්ඩ ( තබ්ලාව / පඛාවාජ්)

- නිර්දේශිත තාලය - ත්‍රීතාල්/ඒක්තාල්
- තාලයට අදාල පරිදි වාදනයේ දී අන්තර්ගත විය යුතු සියළුම පද වර්ගයන් පිළිවෙලින් සකස් වූ වාදනයක් විය යුතුය.
- විලම්භලයෙන් ආරම්භ කොට මධ්‍යලය සහ ධ්‍රැතලය දක්වා වාදනය සකස්විය යුතුය
- ජේෂ්කාර,කායදා, රේලා, ගත්, මුකුඩා,ටුකුඩා,පරන් සහ චක්‍රදාර් ආදී පද කොටස් වලින් සමන්විය යුතුය.
- නිවැරදි වාදන ඉරියව් සහ හස්ත සාධන පිළිබඳව අවධානය යොමුකල යුතුය.
- කාලය අවම විනාඩි 05 ත් උපරිම විනාඩි 07 ත් අතර විය යුතුය.
- වාදකයා ඇතුළුව උපරිම තිදෙනෙක් සහභාගි කරවා ගත හැක.(ලෙහෙරාව සහ තාම්පුරා වාදනය සඳහා)
- තාලය පිළිබඳ මනා අවබෝධයකින් ලයකාරී වාදන ඉදිරිපත් කිරීම.

1.2.3. ගායනය - (කර්ණාටක)ගැහැණු / පිරිමි - ඒකල - ජ්‍යෙෂ්ඨ

- නිර්දේශිත රාග - කිර්වානි/හම්සද්වනි/ද්විජයවන්ති/මායාමාලවගෞල
- ඉහත රාගයන්ගෙන් එකකට අයත් කීර්තනම් අංගයක් ගායනා කළ යුතුය.
- රාගලාප, නිරවල් සහ කල්පනාස්වරම්,සහිතව ගායනය ඉදිරිපත් කළ යුතුය.
- තරගකරු සමඟ සහභාගී විය හැකි උපරිම ගණන 04 කි.
- කාලය අවම විනාඩි 05ත් උපරිමය විනාඩි 07 ත් අතර විය යුතුය.

1.2.4. වාදනය -( කර්ණාටක ) ගැහැණු / පිරිමි - ඒකළ -ජ්‍යෙෂ්ඨ

1.2.4.1. සුෂිර වාද්‍ය භාණ්ඩ (බටනලා/නාදස්වරම්)

1.2.4.2. තත් වාද්‍ය භාණ්ඩ (වීණාව/වයලීනය/මෝර්සිං)

1.2.4.3. ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ (හාර්මෝනියම්)

- නිර්දේශීත රාගය - කිර්වානි/හම්සද්වනි/හේමවතී/කාම්භොජී /මයාමාලවගෞල
- ඉහත රාගයන්ගෙන් එකකට අයත් කීර්තනම් වාදනයක් ඉදිරිපත් කළ යුතුය.
- රාගාලාප, නිරවල් සහ කල්පනාස්වරම් සහිතව වාදනය ඉදිරිපත් කළ යුතුය.
- තරගරු සමඟ සහභාගි විය යුතු උපරිම ගණන 04 කි.
- කාලය අවම විනාඩි 05 ත් උපරිම විනාඩි 07 ත් අතර විය යුතුය.

1.2.4.4. තාල වාදය භාණ්ඩ (මෘදංගම්/ සටම්/ තව්ල්/ ගන්ජිරා)

- නිර්දේශිත තාලය - ආදි බන්ධවාපු /මිශ්‍ර වාපු
- තාලයට අදාළ පරිදි වාදනයේදී අන්තර්ගත සියළුම පද වර්ග පිළිවෙලින් සකස් වූ තාල වාදනයක් විය යුතුය.
- සාම්ප්‍රදායික වාද්‍ය ශිල්ප ක්‍රම භාවිතා කළ යුතුය.
- කාලය අවම විනාඩි 05 ත් උපරිම විනාඩි 07 ත් අතර විය යුතුය.
- සහාය වාදන ශිල්පියා යොදාගත හැකිය.

දේශබන්ධු මහාචාර්ය කපිල ගුණවර්ධන
ලේකම්,
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

<u>අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන ජාතික සංගීත තරගාවලිය</u>

<u>ප්‍රතිභා 2021</u>

**තරග විනිශ්චය සඳහා ලකුණු ලබා දීමේ පිළිවෙල**

**01 ශාස්ත්‍රීය අංශය**

1.1.ශාස්ත්‍රීය ගායනය / වාදන (ඒකල) කණිෂ්ඨ

1.1.1. ගායනය (හින්දුස්ථානි)
1.1.3. ගායනය (කර්ණාටක)

1.2.ශාස්ත්‍රීය ගායනය / වාදන (ඒකල) ජ්‍යෙෂ්ඨ

1.2.1.ගායනය (හින්දුස්ථානි)
1.2.3.ගායනය (කර්ණාටක)

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | සමස්ත ගායනය තුළම ශෘතිය පවත්වා ගැනීම සහ ලය පවත්වා ගැනීම. | 30 |
| 02 | ස්වර ස්ථාන නිවරදි බව. (රාගානුකූල ස්වර සාධනය) | 15 |
| 03 | තොරාගත් රාගයට අදාළ රාගාංගවලින් යුක්තවීම සහ තෝරාගත් සංගීත සම්ප්‍රදායේ ගායන ශෛලීන් ප්‍රකට වීම. | 25 |
| 04 | සුවිශේෂ දක්ෂතා (මධ්‍යලාප , මූර්කි, කන් ස්වර, ගමක් සුදුසු තැන්වලදී යොදා ගායනය විචිත්‍ර කර ගැනීම. | 20 |
| 05 | ඉදිරිපත් කිරීම (ගායන දෝෂවලින් තොර බව, උචිත ඉරියව් සහ සංයමය, වාදන ගැළපීම සහ සංවිධානාත්මක බව. | 10 |

1.1.ශාස්ත්‍රීය වාදනය (ඒකල) කණිෂ්ඨ

1.1.2.වාදනය (හින්දුස්ථානි)
1.1.4.වාදනය (කර්ණාටක)

1.2.ශාස්ත්‍රීය වාදනය (ඒකල) ජ්‍යෙෂ්ඨ

1.2.2.වාදනය (හින්දුස්ථානි)
1.2.4.වාදනය (කර්ණාටක)

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | ශෘතිය මත පිහිටා සමස්ත වාදනය පැවැත්වීම, වාද්‍ය භාණ්ඩ නිවැරදිව සුසර කර තැබීම. | 20 |
| 02 | ස්වර ස්ථාන නිවැරදි බව (රාගානුකූල ස්වර සාධනය) | 15 |
| 03 | තෝරාගත් රාගයට අදාළ රංගාංගවලින් යුක්තවීම. ස්ථායි,අන්තරාආලාප, තානාලංකාර මධ්‍ය හා ධෘතගලයෙන් වාදනය කිරීම හා ලය පවත්වා ගෙන යාම. | 30 |
| 04 | සුවිශේෂ දක්ෂතා (මධ්‍යලාප, තානාලංකාර හා තාලාවබෝධය, ලයකාරී ගමක්, මූර්ති, කට්කා, චක්‍රධාරී, තිහායි ආදිය විචිත්‍රව ඉදිරිපත් කිරීම, ස්වරමාධූරිය | 25 |
| 05 | නිවැරදි වාදන ඉරියව්(වයන භාණ්ඩයට අදාළව )සහාය වාදන සංවිධානාත්මක බව, ආරම්භයේ සහ අවසානයේ ක්‍රමවත් .බව | 10 |

1.1.2.4.තාල වාද්‍ය භාණ්ඩ(තබ්ලාව/පඛ්වාජ)
1.1.4.3.තාල වාද්‍ය භාණ්ඩ(මෘදංගය/සටම්/ගන්ජිරා)
1.1.4.4.යුගල වාදනය (තවිල්/නාදස්වරම්)

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | තාලාක්ෂර නිවැරදි බව, තාල වාද්‍ය භාණ්ඩය නිවැරසිව සුසර කර තැබීම. | 10 |
| 02 | තෝරාගත් තාලය සහ ලෙහෙරාව ගැළපීම, ලය පවත්වා ගැනීම. | 20 |
| 03 | තබ්ලා වාදන අන්තර්ගතය (කයදා,ගත්,මුඛඩා,තිහායි,පරන්,චක්‍රධාර ආදිය | 20 |

| | | |
|---|---|---|
| 04 | සුවිශේෂ දක්ෂතා (අත හැසිරවීම,පද උච්ඡාරණය,ලයකාරී පෙන්වීම,පදරටා,විවිධත්වය සහ ප්‍රමාණය,වාදන මාදූර්ය) | 40 |
| 05 | ඉදිපරිපත් කිරීම (වාදන ඉරියව් සහාය වාදන සංවිධානාත්මක බව,සංයමය, ප්‍රාසාංගික බව) | 10 |

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | සමස්ත ගායනය තුළම ශැතිය පවත්වා ගැනීම සහ ලය පවත්වා ගැනීම. | 30 |
| 02 | ස්වර ස්ථාන නිවරදි බව. (රාගානුකූල ස්වර සාධනය) | 15 |
| 03 | තොරාගත් රාගයට අදාළ රාගාංගවලින් යුක්තවීම සහ තෝරාගත් සංගීත සම්ප්‍රදායේ ගායන ශෛලීන් ප්‍රකට විම. | 25 |
| 04 | සුවිෙෂ දක්ෂතා (මධ්‍යලාප , මූර්ති,කන් ස්වර,ගමක් සුදුසු තැන්වලදී යොදා ගායනය විචිත්‍ර කර ගැනීම. | 20 |
| 05 | ඉදිරිපත් කිරීම (ගායන දෝෂවලින් තොර බව, උචිත ඉරියව් සහ සංයමය,වාදන ගැළපීම සහ සංවිධානාත්මක බව. | 10 |

දේශබන්ධු මහාචාර්ය කපිල ගුණවර්ධන
ලේකම්,
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.